# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1689/20 - 2011 ජනවාරි 21 වැනි සිකුරාදා - 2011.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත යටතේ නියෝග

සුරාබදු නිවේදන අංක 935

සුරාබදු ආඥාපනතේ (52 වැනි අධිකාරය) 25 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, සුරාබදු ආඥාපනතේ 7(ඒ) වගන්තියෙන් සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාට පැවරී ඇති බලතල අනුව සංචාරක හෝටල් සඳහා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ පූර්ව අනුමැතිය ඇතිව හා අන්තර් ජාතික ප්‍රමිතීන් පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ නිරන්තර අධීක්ෂණය සහිතව පවත්වාගෙන යනු ලබන හෝටල් සඳහා පහත කොන්දේසිවලට යටත්ව වයින්, බියර් සහ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙළ කළ මධ්‍යසාර වර්ග අදාළ පරිශ්‍රය තුළ භාවිතා කිරීමට බලය දෙමි.

01. සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් පහත කරුණු සනාථ කරමින් නිකුත් කරනු ලබන සහතිකයක් මත, —

(i) මහ නගර සභා සීමාවන් තුළ ඉදි කරනු ලබන හෝටල් සඳහා කරනු ලබන ආයෝජනය ඇමරිකානු ඩොලර් මිලියන 04 කට නොඅඩු හෝ ඒ හා සමාන ශ්‍රී ලංකා මුදල්වලට නොඅඩු හා මහ නගර සභා සීමාවලින් පිටත ඉදි කරනු ලබන හෝටල් සඳහා කරනු ලබන ආයෝජනය ඇමරිකානු ඩොලර් මිලියන 02 කට නොඅඩු හෝ ඒ හා සමාන ශ්‍රී ලංකා මුදල්වලට නොඅඩු බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය ;

(ii) හෝටලය තරු තුනේ හෝ ඊට ඉහළ හෝටලයක් ලෙස හෝ බුටික් හෝටලයක් ලෙස හෝ බුටික් විලා ගණයට වැටෙන හෝටලයක් ලෙස හෝ පෞරාණික වැදගත්කමක් ඇති හෝටලයක් ලෙස ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය මගින් පිළිගෙන තිබිය යුතු ය ;

(iii) බුටික් හෝටලයක් ලෙස හෝ බුටික් විලා හෝටලයක් ලෙස හෝ පෞරාණික වැදගත්කමක් ඇති හෝටලයක් ලෙස හෝ එම මට්ටමේ ප්‍රමිතීන් මත මහ නගර සභා සීමාවන් තුළ ඉදි කරනු ලබන හෝටලයක කාමර සංඛ්‍යාව 15 කට නොඅඩු විය යුතු අතර, ඉන් පිටත ප්‍රදේශවල කාමර සංඛ්‍යාව 07 ක් හෝ ඊට වැඩි විය යුතු ය.

1A - G 14050 — 1330 (2011/01)

සහ

02 (i) මෙම අනුමැතිය ලබා ගැනීමට පෙර මෙම නිවේදනයේ II කොටසේ සඳහන් ගාස්තු ගෙවා තිබිය යුතු ය.

(ii) අනුමැතිය ලිත් වර්ෂ තුනකට වලංගු ය.

(iii) මෙම අනුමැතිය I කොටසේ සඳහන් කොන්දේසි හා සීමා කිරීම්වලට යටත් ය.

සහ

(iv) මෙම අනුමැතිය නිකුත් කරන්නේ III කොටසේ සඳහන් ආකෘතිය මගින් පමණි.

තවද, 2010.09.28 වැනි දින අංක 1673/8 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 920 දරන සුරාබදු නිවේදනය මෙයින් පරිච්ජින්න කරනු ලැබේ.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2011 ජනවාරි මස 20 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

I වැනි කොටස

*රීති*

(1) සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය) 18 වැනි වගන්තිය යටතේ වයින්, බියර් හා පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කළ මධ්‍යසාර වර්ග භාවිත කිරීම මෙම රීතිවලට අනුව විය යුතු ය.

(2) හෝටලය යනු ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය මගින් අනුමත කරනු ලැබූ මහ නගර සභා සීමාව තුළ නම් ඩොලර් මිලියන 04 කට ද, ඉන් පිටත ප්‍රදේශවල නම් ඩොලර් මිලියන 02 කට ද, වඩා ආයෝජනය කර ඇති තරු තුනේ හෝ ඊට ඉහළ හෝටලයක්, බුටික් හෝටලයක්, බුටික් විලා හෝටලයක් හෝ පෞරාණික වැදගත්කමක් ඇති හෝටලයක් විය යුතු ය.

(3) (i) අනුමත තොග වෙළෙන්දෙකුගෙන් හැර වෙනත් තැනකින් අදාළ මධ්‍යසාර පානයන් ලබා ගැනීම තහනම් ය. හෝටලයට ගෙන එනු ලබන හා භාවිත කරනු ලබන මධ්‍යසාර පානයන් පිළිබඳ ගිණුම්, සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කර ඇති ආකෘතිවල පවත්වාගෙන යා යුතු ය.

(ii) මධ්‍යසාර පානයන් සංග්‍රහ කිරීම සඳහා බලය හෝටලයට ලබාදෙනු ලැබේ. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ හා සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාගේ එකඟත්වයකින් තොරව හෝටලයේ අයිතිය වෙනස්වීමක් හෝ පැවරීමක් නොකළ යුතු ය. එවැනි වෙනස්වීමක් බලාත්මක වනුයේ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ හා සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා අනුමත කිරීමෙන් පසුව හා රුපියල් ලක්ෂ දහයක (10) මුදලක් බැඳීමෙන් පසුවය.

(iii) හෝටල් පරිශ්‍රය තුළ මධ්‍යසාර පානයන් පරිභෝජනයට අවසර ඇත.

(iv) මධ්‍යසාර පානයන් සඳහා අනුමැතිය මුදල් වර්ෂ තුනක කාලයක් සඳහා ලබාදෙනු ලැබේ. වර්ෂය තුළ දී අලුතින් නිකුත් කරනු ලබන අනුමැතියක් එම වර්ෂයේ ඉතිරි කාලය සඳහා ද, ඊලඟ මුදල් වර්ෂ දෙකක කාලයක් සඳහා ද වලංගු වේ.
අදාළ අනුමැතිය තුන් අවුරුදු කාලයකින් පසු දීර්ඝ කිරීමට අවශ්‍ය වන්නේ නම් බලපත්‍රය අවසන් වීමට දින 45 කට කලින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ නිර්දේශය සහිතව සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත අදාළ ඉල්ලීම ඉදිරිපත් කළ යුතු ය.

(v) පසළොස්වක පෝය දිනවල දී මධ්‍යසාර පානයන් විකිණීමක් නොකළ යුතු ය.

(vi) මධ්‍යසාර පානයන් භාවිතය සඳහා ලබාදෙනු ලබන අනුමැතිය සුරාබදු නිවේදන 902 හි සඳහන් ''ර. බ්. 7 බලපත්‍ර'' හා සමාන වේ. අනුමැතිය ලබාදෙන පරිශ්‍රය තුළ සඳහන් කර ඇති මධ්‍යසාර පානයන් භාවිතය සඳහා II කොටසේ සඳහන් ගාස්තුවලට අමතරව වෙනත් ගාස්තු අය කරනු නො ලැබේ.

(vii) හෝටලයේ මුළුතැන් ගෙය, වැසිකිළි සවි කිරීම්, ආහාර හා අවට පරිසරය ඉහළ ප්‍රමිතියකින් පවත්වාගෙන යා යුතු ය.

(viii) සෑම වසරක් අවසානයේ දී ම හෝටලය සංචාරක ප්‍රවර්ධන අධිකාරිය තීරණය කරනු ලබන ප්‍රමිතීන්වලට අනුකූලව පවත්වාගෙන යනු ලබන බවට ලබාගත් සහතිකයක් සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ix) ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය මගින් හෝටලයට ලබා දී ඇති අනුමැතිය අවලංගු වුවහොත් සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් මධ්‍යසාර පානයන් භාවිතය සඳහා ලබා දී ඇති අනුමැතිය ඉබේම අහෝසි වන්නේ ය.

(x) ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය විසින් හා සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවා ඇති රීති කඩ කළහොත් මධ්‍යසාර භාවිතය සඳහා ලබා දී ඇති අනුමැතිය අවලංගු වන්නේ ය. තව ද, සුරාබදු ආඥාපනතේ විධාන අනුව මෙහි සඳහන් රීති කඩකර ඇති බව අනාවරණය වුවහොත් කාර්මික අපරාධ වාර්තා ඉදිරිපත් කරනු ලැබේ. ලබා දී ඇති අනුමැතිය වෙනස් කළ හැක්කේ සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාට පමණි.

## II වැනි කොටස

*මධ්‍යසාර භාවිතය සඳහා අයකරනු ලබන තුන් අවුරුදු ගාස්තුව*

| | *බලපත්‍රයේ ස්වභාවය* | *තරු 3 හා තරු 4 හෝටල් (රු.මිලියන)* | *තරු 5 හා ඊට ඉහළ ගණයේ හෝටල්/බුටික් හෝටල්, බුටික් විලා /පෞරාණික වැදගත්කමක් ඇති හෝටල් (රු.මිලියන)* |
|---|---|---|---|
| 1. | කාමර 250 හෝ ඊට වැඩි | 3.0 | 5.0 |
| 2. | කාමර 200 හෝ ඊට වැඩි | 2.25 | 4.0 |
| 3. | කාමර 100 හෝ ඊට වැඩි | 1.75 | 3.0 |
| 4. | කාමර 50 හෝ ඊට වැඩි | 1.25 | 2.0 |
| 5. | කාමර 07 හෝ ඊට වැඩි | 0.75 | 1.0 |

;

## III වැනි කොටස

*ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව*

සංචාරක ප්‍රවර්ධන අධිකාරිය විසින් අනුමත කරනු ලබන හෝටල් සඳහා වයින්, බියර් හා පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කළ මධ්‍යසාර වර්ග විකිණීම පිණිස සුරාබදු ආඥාපනතේ (52 වැනි අධිකාරය) 18 වැනි වගන්තිය යටතේ නිකුත්කරනු ලබන විශේෂ අනුමැති ය.

(1) දිස්ත්‍රික්කය :............................................. අනුමත අංකය :.............................................
නිකුත් කළ දිනය :............................................. අවලංගුවන දිනය :.............................................
හෝටලයේ වර්ගය :............................................. :.............................................
කාමර ගණන :............................................. ගාස්තුව :.............................................
මුද්දර ගාස්තුව :............................................. :.............................................

(2) හෝටලයේ නම සහ ලිපිනය :
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

(3) සුරාබදු ආඥාපනතේ 18 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉහත සඳහන් හෝටලයේ වයින්, බියර් හා පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කළ මධ්‍යසාර වර්ග භාවිතය සඳහා අනුමැතිය දෙමි.

..........................................................................
දිනය :........................................ සුරාබදු කොමසාරිස් ජනරාල්.

***පිටපත් :***

1. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය
2. සහකාර සුරාබදු කොමසාරිස් (...........................පළාත)
3. සුරාබදු අධිකාරී (.........................................)
4. සුරාබදු ස්ථානාධිපති (.........................................)

02-387

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.